පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණි... ...ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍ය... ...රු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය

**5**

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට**

**පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය**

**(පෙරහුරු විභාගය)**

**පැය 1 මිනිත්තු 15 යි.**

# II පත්‍රය

**නම : ............................................................ අංකය : ......................**

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස් :**

- ❖ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ❖ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- ❖ පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- ❖ පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
- ❖ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

| | අවසාන ලකුණ |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

**සරත් ආනන්ද ගුරුතුමාගේ නිර්මාණයකි.**

[ 2 වැනි පිටුව බලන්න.]

**01 පහත සඳහන් ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

මුළු පරිසරය ම සඳ රැසින් නැහැවී ඇත. පොල් රුප්පා අතරින් සඳරැස් වැටී ඇති ආකාරය දැකුම්කලු ය. සුදුපාට වැලිතලා මතට සුදු සඳ රැස් වැටීමෙන් ඒවා කිරි සයුරක් බවට පත්වී ඇත. රැ කුමාරි, කුමුදු, හෙන්දිරික්කා, කඩුපුල් මල් ගොමුවකට සඳරැස් වැටුණු කල එහි අසිරිය වඩාත් වර්ධනය වේ. සඳ එළියේ දිය තලයේ දිය රැලි සිලි සිලි හඬින් ඉවුරට ඇදී එන අයුරු අපූරු දසුනකි.

i. පොල් රුප්පා අතරින් වැටී ඇත්තේ කුමක් ද? ..........

ii. වැලි තලා මතට සඳරැස් වැටුණු විට එය කුමක් බවට පත්වේ ද? ..........

iii. මෙහි සඳහන් මල් වර්ග දෙකක නම් ලියන්න. ..........

iv. මල් ගොමුවට සඳරැස් වැටීමෙන් එහි අලංකාරයට කුමක් සිදුවේ ද? ..........

v. ඉවුරට දියරැලි ඇදී එන විට නැගෙන හඬ කුමක් ද? ..........

vi. මෙහි යෙදී ඇති සඤ්ඤක අකුරක් යෙදුණු වචනයක් ලියන්න. ..........

**02 පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කර ලියන්න.**

i. ගඟට ..........

ii. නරියා මිදි ..........

**03 පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු විරාම ලක්ෂණ යොදන්න.**

i. මල්ලියේ දැන් වේලාව කීය ද

ii. තේ පොල් රබර් ලංකාවේ ප්‍රධාන වැවිලි වර්ග වේ

**04 පහත සඳහන් වාක්‍යවලට සුදුසු අතීතකාල ක්‍රියා පද යොදන්න.**

i. අම්මා ඊයේ මිදුල ..........

ii. ගොවියෝ කුඹුරු ..........

**05 පහත සඳහන් අකුරුවලට ඒ ඉදිරියෙන් දක්වා ඇති පිල්ලම යෙදුණු විට සෑදෙන අකුර තිත් ඉරමත ලියන්න.**

i. ක අකුරට දික් පාපිල්ල - ..........

ii. ර අකුරට දික් පාපිල්ල - ..........

**06 පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍ය සකස් කර ලියන්න.**

i. ඔරුව / වඩා / නැවැත්වුයේ / මෙවර / තැනක ය / හොඳ

..........

ii. ඇද්දෙමු / අපි / ගොඩට / තුළ / දේ / ඔරුව / තිබූ

..........

**07 පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.**

i. කෑම ..........        ii. වාද ..........

විභාග අංකය : ..............................................

**08 පහත සඳහන් ස්ත්‍රී ලිංග පද සඳහා සුදුසු පුරුෂ ලිංග පද ලියන්න.**

i. ගිරවී - ..................................  ii. කිරිල්ලී - ....................................

**09 පහත සඳහන් පද සඳහා සුදුසු විරුද්ධ පද ලියන්න.**

i. අනවශ්‍ය - ..................................  ii. නුපුහුණු - ....................................

**10 පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

උදෑසනින් අවදි වෙලා
ඇඹුලට කිරිබත් උයලා
නියර දිගේ පාද තබා
යන ගෙවිලිය හරිම හොඳා

i. මෙහි හරිම හොඳ කෙනෙක් වන්නේ කවු ද? ..........................................................................

ii. දවස ආරම්භ කිරීම සඳහා මෙහි ඇති හොඳ පුරුද්දක් වන්නේ කුමක් ද? ...........................................

**11 පහත සඳහන් දෙමළ වචන සිංහල බසට හරවා ලියන්න.**

i. සන්දෛ - ..................................  ii. බස් නීලෛයම් - ....................................

**12 පහත සඳහන් සිංහල වාක්‍ය දෙමළ බසට හරවා සිංහල අකුරෙන් ලියන්න.**

i. මගේ නම සමන් - ..........................................................................................

ii. ඔබ කවු ද? - ..........................................................................................

**13 පහත රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය, ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

i. 

..........................................

ii. 


..........................................

**14 පහත සඳහන් ඉංග්‍රීසි වාක්‍ය සිංහලට හරවා ලියන්න.**

i. Where are they? - ..........................................................................................

ii. I am going to the canteen. - ..........................................................................................

**15** එක්තරා සංඛ්‍යාවක් තුනෙන් බෙදා ලැබෙන සංඛ්‍යාව පහත පරිදි ගණක රාමුවේ දක්වා තිබුණි. මුල් සංඛ්‍යාව කුමක් ද?




..........................................................

**16** 14 047ට 153ක් වැඩි සංඛ්‍යාව අකුරෙන් ලියන්න. ..................................................................................................

**17** බසයක මගීන් 54 දෙනෙකුට ආසන පහසුකම් ඇත. මගීන් 48ක් රැගෙන ගමන් ඇරඹූ බස්රථයකට පළමු නැවතුමෙන් මගීහු 07ක් ද දෙවන නැවතුමෙන් මගීහු 8ක් ද ගොඩවූහ. තෙවන නැවතුමේ දී මගීහු 6ක් බැස ගියහ.

i. තුන්වන නැවතුමෙන් පසු මගීන් කී දෙනෙක් සිටගෙන ගමන් කරන්නේ ද? ..............................................

i. පළමු නැවතුමේ සිට තුන්වන නැවතුම දක්වා කී දෙනෙක් සිටගෙන ගමන් කළේ ද? .............................

**18** බසයක් ගාල්ල සිට කොළඹ බලා යාමට පැය 3 මිනිත්තු 10ක කාලයක් ගත කරයි. පෙ.ව. 11.30 ට ගාල්ලෙන් පිටත් වූ බසය කොළඹට පැමිණෙන වේලාව පැය 24 ඔරලෝසුවේ වේලාවෙන් දක්වන්න.

..........................................................................................................

**19** **ළමුන් පිරිසක් තමන්ගේ පාසල ඉදිරිපිටින් ගමන් ගත් වාහන පිළිබඳව තොරතුරු පහත වගුවේ දැක්වෙන ආකාරයට සටහන් කර ගත්හ. ඒ අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වාහනය | වාර්තා කළ අයුරු | සංඛ්‍යාව |
|---|---|---|
| කාර් | ///// // | 07 |
| බස් | //// | .......... |
| යතුරු පැදි | ///// ///// // | .......... |
| ත්‍රිරෝද රථ | ///// // | .......... |

i. මෙම වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

ii. මෙම කාලය තුළ ගමන් ගත් රෝද හතරට අඩු වාහන සංඛ්‍යාව රෝද හතර හෝ එයට වඩා වැඩි රෝද ගණනක් තිබූ වාහන සංඛ්‍යාවට වඩා කොපමණ වැඩි ද? ..........................................................

**20** චොකලට් බෝල පෙට්ටියක බෝල 18ක් තිබේ. එබඳු පෙට්ටි 5ක් එක ලොකු පෙට්ටියක තිබේ. වෙළෙඳ සැලකට එබඳු ලොකු පෙට්ටි 6ක් ගෙන ආවේ නම් එහි ඇති චොකලට් බෝල ගණන කීය ද? ..........................................................

**21** ඇසුරුමක යෝගට් 12ක් තිබේ. එක් අයෙකුට 2 බැගින් 48 දෙනෙකු අතර බෙදා දීම සඳහා යෝගට් ඇසුරුම් කීයක් අවශ්‍ය ද? ..........................................................

**22** බීම බෝතලයක බීම ලීටර 2 ප්‍රමාණයක් තිබේ. එබඳු බීම බෝතල් 5ක් උත්සවයක් සඳහා ගෙන එන ලදී. ඉතිරි වූයේ එක් බීම බෝතලයකින් $\frac{1}{2}$ ක ප්‍රමාණයක් පමණි. එසේ නම් කොපමණ බීම ප්‍රමාණයක් භාවිත කර තිබේ ද? ..........................................................


**23** 400g බැගින් වූ කිරි පැකට් 7ක් මිලට ගත් හෝටලයක් එයින් කිරිපිටි 1kg 750g ක ප්‍රමාණයක් භාවිත කළේ නම් ඉතිරි කිරිපිටි ප්‍රමාණය කොපමණ ද? ..............................................

**24** බල්බ වැලක නිල් හා රතු බල්බ තිබේ. නිල් බල්බය සෑම මිනිත්තු 5කට ම වරක් ද, රතු බල්බය සෑම මිනිත්තු 4කට වරක් ද දැල්වේ. ප.ව. 6.00ට බල්බ දෙක ම එකවර දැල්වුණු අතර නැවත බල්බ දෙක ම එකවර දැල්වෙන්නේ මිනිත්තු කීයකට පසුව ද? ..............................................



[ 5 වැනි පිටුව බලන්න.]

**25** පහත රූප සටහනෙන් දැක්වෙන්නේ නගර කිහිපයක් අතර දුර ප්‍රමාණ පිළිබඳ විස්තරයි. ඒ අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ළමයෙක් A නගරයේ සිට D නගරය වෙත ගියේ ය. තවත් ළමයෙක් C නගරයේ සිට G නගරය වෙත ගොස් ආපසු C නගරයට පැමිණියේ ය. මේ දෙදෙනා ගමන් කළ දුර අතර වෙනස කොපමණ ද?

......................................................


ii. G නගරයේ සිට A නගරයට පැමිණි ළමයෙක් ගමන් කරන මුළු දුර කොපමණ ද? ......................................

**26** රු.41.50 ක් වටිනා භාණ්ඩයක් මිලට ගෙන රු.100.00 කින් එම මුදල ගෙවන ලද අසංකට නෝට්ටු එකක් හා කාසි වර්ග හතරකින් ඉතිරි මුදල ලැබුණි. එය ලැබුණු ආකාරය ලියා දක්වන්න.

රු. ...................... + රු. ......................... + රු. .......................... + රු. .......................... + සත ..................

**27** බර 25kg බැගින් වූ රතු සීනි මිටි 6ක් හා සුදු සීනි මිටි 5ක් එක්තරා වෙළෙඳ සැලක තිබුණි. වෙළෙඳසැලේ තිබූ මුළු සීනි ප්‍රමාණය කොපමණ ද? ......................................................


**28** **ළමයෙක් ගමන් ගත් මාර්ගයක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




i. දැන් ළමයා මුහුණ ලා සිටින දිශාව කුමක් ද? ...........................................................................................

ii. ළමයා මේ ගමනේ දී කී වරක් ඔහුගේ වම් පැත්තට හැරී ගමන් කර තිබේ ද? ..............................................

**29** පහත ඔරලෝසු මුහුණතේ දැක්වෙන්නේ පස්වරු වේලාවකි. එම වේලාව කීය ද?



......................................................................

**පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**30** කැරොල් ගීත ප්‍රසංග පවත්වනු ලබන්නේ කුමන ආගමිකයන් විසින් ද ?

i. හින්දු  ii. බෞද්ධ  iii. කතෝලික

31. දිනපතා ප්‍රමාණවත් පරිදි ජලය පානය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක් ද?

i. වකුගඩු නීරෝගී වීම.
ii. සම පැහැපත් වීම.
iii. ආහාර වේල් තුන ම ගැනීමට අවශ්‍ය නොවීම.

32. ජීවිතයට ආභරණයක් ලෙස සැලකිය යුතු වැදගත් දෙයක් වන්නේ මින් කුමක් ද?

i. මුතු මාල   ii. රන් රිදී   iii. සරල බව

33. අපේ රටේ ජාතික පුෂ්පය වන්නේ මින් කුමක් ද?

i. නා මල   ii. වෙසක් මල   iii. මානෙල් මල

34. එළවළු පාත්තිවලට සිදුවන කෘමි හානි වළක්වා ගැනීමට වගා කරන මල් වර්ගයක් වන්නේ මින් කුමක් ද?

i. සේපාලිකා   ii. සූරියකාන්ත   iii. දාස් පෙතියා


35.



මෙම ක්‍රීඩකයන් යෙදී සිටින ක්‍රීඩාව කුමක් ද?

i. වොලිබෝල්
ii. දැල් පන්දු
iii. පා පන්දු

36.



මෙම උපකරණ භාවිත වන්නේ කුමන කර්මාන්තයක දී ද?

i. පෙදරේරු කර්මාන්තය
ii. වඩු කර්මාන්තය
iii. කම්මල් කර්මාන්තය

37. අපට ආවේණික අපේ උරුමයක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?

i. විශ්ව කෝෂය   ii. ශබ්ද කෝෂය   iii. ත්‍රිපිටකය

38. ලෝක උරුමයක් බවට පත්ව ඇති අපේ ජාතික උරුමයක් වන්නේ මින් කුමක් ද?

i. ජනාධිපති මන්දිරය   ii. දළදා මාලිගාව   iii. කළුතර බෝධිය

39. උප්පැන්න, මරණ ලියාපදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳ කටයුතු සිදු කරන රාජ්‍ය ආයතනය කුමක් ද?

i. ප්‍රාදේශීය සභාව   ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
iii. නගර සභාව


40. ඇට වැඩි ම සංඛ්‍යාවක් ඇති කරල වන්නේ මින් කුමක් ද?

i. දඹල කරල   ii. බණ්ඩක්කා කරල   iii. බඩඉරිඟු කරල

41. වියළී පුපුරා යෑම නිසා බීජ අවට විසිරී යන්නේ මෙයින් කුමන කරලේ ද?

i. වී කරල   ii. මුරුංගා කරල   iii. මදටියා කරල

42. මෙහි දැක්වෙන සතාගේ පදවල දක්නට ලැබෙන විශේෂත්වය කුමක් ද?



i. පාද ශක්තිමත් වීම.
ii. පාද වල ඇඟිලි පිහිටා තිබීම.
iii. පෘෂ්ඨයකට ඇලී සිටීම සඳහා විශේෂයෙන් සකස් වී තිබීම.

43 මල්වල පරාගනය සඳහා දායක නොවන සතෙක් වන්නේ මින් කවුරුන් ද?

i. කනෙයියා මැස්සා　　ii. මී මැස්සා　　iii. දළඹුවා

44 පාසල තුළ ඇති විවිධ උපකරණ විවිධ ස්ථානවල තැබීමට හේතුවක් වන්නේ මින් කුමක් ද?

i. එක ම තැනක තැබීමට ඉඩ මදි වීම.
ii. ආරක්ෂාව සඳහා.
iii. එක් එක් ස්ථාන, ඒකකවලින් සිදු කරන කාර්යයන්ට අදාළ උපකරණ එම ස්ථානවලින් තබා තිබෙන නිසා.

45 අතීතයේ වංගෙඩිය හා මිරිස් ගල උපකරණවලින් කළ කාර්යය නූතන මුළුතැන්ගෙය තුළ සිදු කරන්නේ කුමන උපකරණය මගින් ද?

i. විදුලි උඳුන　　ii. බ්ලෙන්ඩරය　　iii. විදුලි හිරමනය

46 කාන්දමක් හෙවත් චුම්භකයක් භාවිත නොවන උපකරණයක් වන්නේ මින් කුමක් ද?


i. ගුවන් විදුලිය　　ii. ස්ථාවර දුරකථනය
iii. විදුලි හිරමනය

47 විටමින් B බහුල ආහාරයක් වන්නේ මින් කුමක් ද?

i. ලාවුලු　　ii. බිත්තර　　iii. තද කොළපාට කොළ වර්ග හා එළවළු

48 නෙල්ලි, පේර, දොඩම් වැනි පලතුරුවල බහුල ව ම ඇති විටමින් වර්ගය වන්නේ මින් කුමක් ද?

i. විටමින් D　　ii. විටමින් C　　iii. විටමින් A

49 

මෙම නිර්මාණය සඳහා යොදා ගන්නේ මින් කුමන ද්‍රව්‍ය ද?

i. ගොක් කොළ　　ii. ශාක පත්‍ර　　iii. වර්ණ කඩදාසි

50 තුරගා වන්නමේ ඇතුළත් වන්නේ කුමන සතාගේ ගමන් විලාශය ද?

i. අලියා　　ii. අශ්වයා　　iii. හාවා

51 හදිසි අනතුරක දී ප්‍රථමාධාර ලබාදීම මගින් බලාපොරොත්තු වන්නේ මින් කුමක් ද?

i. වෛද්‍යවරයා වෙත යාම වළක්වා ගැනීම.
ii. රෝගියාට සිදුවිය හැකි හානිය අවම කර ගැනීම.
iii. රෝගියා සම්පූර්ණයෙන් ම සුවපත් කිරීම.

52 අපගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමේ දී මෙයින් වඩාත් වැදගත් ම දේ කුමක් ද?

i. අනතුරකින් පසුව සිදු කරන දේ.
ii. අනතුරක් සිදුවීම වළක්වා ගැනීමට කළ යුතු දේ.
iii. අනතුරක් සිදුවූ විට එයට වැරදිකරු සොයා බැලීම.

53 ඖෂධ සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ මින් කුමක් ද?

i. ඖෂධවල මිල　　ii. ඖෂධ ලබා ගත යුතු වාර ගණන
iii. ඖෂධවල රසය

54 කතෝලිකයන් ජලය සම්බන්ධව සිදු කරන චාරිත්‍රයක් වන්නේ මින් කුමක් ද?

i. කුම්භාභිෂේකම් ii. ප්‍රසාද ස්නාපනය iii. පිරිත් පැන් ඉසීම.

55 වගා කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ පහත බීජ අතරින් කවර බීජ ද?

i. ජලයේ පාවෙන බීජ ii. ජලයේ ගිලෙන බීජ

iii. උණු වතුරින් තම්බාගත් බීජ


56 වැඩ පහසු කර ගැනීමේ ක්‍රියාවලියේ දී රෝද යොදා ගනු ලබන අවස්ථාවක් නොවන්නේ මින් කුමක් ද?

i. කප්පි ය. ii. දැති රෝද/දම්වැල් iii. ආනත තල

57 යාන්ත්‍රික කොටස්වල තෙල්,ග්‍රීස් යෙදීම මගින් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

i. ඉන්ධනයක් ලෙස යොදා ගැනීම.
ii. එම උපකරණ පිරිසිදු කර ගැනීම.
iii. සුමට ලෙස ද්‍රව්‍ය ස්පර්ශ වීමට සලස්වා වැඩ පහසු කර ගැනීම.

58 උත්තර ධ්‍රැවය රතු පාටිනුත් දක්ෂිණ ධ්‍රැවය නිල් පාටිනුත් ලෙස ධ්‍රැව වර්ණ කරන ලද චුම්බකයක් පහත ආකාරයට නූලකින් එල්ලා තබන ලදී.



දැන් සිදුවිය හැක්කේ කුමක් ද?

i. නිල් පාට පැත්ත උතුරු දිශාවට හැරීම.
ii. රතු පාට පැත්ත දකුණු දිශාවට හැරීම.
iii. රතු පාට පැත්ත උතුරු දිශාවට හැරීම.

59 "බැද්ද වටට සුදු මොරමල් පිපීලා
සද්ද කර බඹරු ඒ මග කියාලා...." මෙම කවිය අයත් වන්නේ කුමන ජනකවි වර්ගයට ද?

i. පැල් කවි ii. බඹර කවි iii. පාරු කවි

60 " මගේ ආදරණීය මව්බිම " යන මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාතය සම්බන්ධය නිවැරදි අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. එක් වාක්‍යයක වචන පහක්වත් තිබිය යුතු ය.

i. ........................................................................................................

........................................................................................................

ii. ........................................................................................................

........................................................................................................

iii. ........................................................................................................

........................................................................................................